# මහජනතාව වෙත කෙරෙන නිවේදනය යි.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු වලින් ලැබෙන ඉපයීම් ලෙස විදේශ ව්‍යවහාර මුදල් ඔබට ලබා ගත හැකි ද?

- ඔබට විදේශ ව්‍යවහාර මුදල් ලැබෙන්නේ,
  - ශ්‍රී ලංකාව තුල නේවාසික නොවන පුද්ගලයන් හට සපයන ලද භාණ්ඩ හා සේවා තුළින් නම්, හෝ
  - ගුවන්තොටුපළක දී / වරායක දී තීරු බදු රහිතව භාණ්ඩ හා සේවා සැපයීමේ දී නම්,

**ඔව්**

- එසේ ඔබ විසින් බාර ගන්නා ලද මුදල් දින 7 ක් තුළ ඔබගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට බැර කළ යුතු ය.
- ඔබගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ පවත්නා ශේෂය ඔබගේ අනාගත විදේශ සංචාර සහ වෙනත් අවසරලත් විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙනු සඳහා භාවිත කළ හැකි ය.

## විදේශ මුදල් ඔබ සන්තකයේ තබා ගත හැකි ද?

- විදේශයක දී රැකියාවක, වෘත්තීයක හෝ ව්‍යාපාරයක යෙදීමෙන් උපයා ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ ව්‍යාවහාර මුදල් ඕනෑම ප්‍රමාණයක් දින 90 ක් දක්වා

---

- විදේශ සංචාර සඳහා ලංකාවේදී බැංකුවකින් ලබා ගත් නමුත් විදේශ සංචාරයේදී භාවිතයට නොගෙන නැවත ශ්‍රී ලංකාවට ගෙන එන ලද; හෝ
- විදේශ සංචාර සඳහා ඔබගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් ලබා ගන්නා ලද; හෝ
- විදේශයකට සේවා සැලසීම හෝ භාණ්ඩ සැපයීම වෙනුවෙන් ගෙවීමක් ලෙස විදේශයකින් ලද;

විදේශ ව්‍යවහාර මුදලක් වන්නේ නම්, ඇ.එ.ජ. ඩොලර් 15,000 (හෝ ඊට සමාන වෙනත් විදේශ ව්‍යවහාර මුදලක්) දක්වා ඕනෑම කාල සීමාවක් සඳහා

**ඔව්**

## ඔබ සන්තකයේ පවත්නා විදේශ ව්‍යවහාර මුදල් සඳහා නව අවස්ථාවන්

- පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කර එම මුදල් තැන්පත් කිරීම සහ පොළී ඉපයීම, අනාගත විදෙස් සංචාර සඳහා සහ අවසරලත් විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සඳහා භාවිත කිරීමට
- දැනට පවත්නා පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීම සහ පොළී ඉපයීම, අනාගත විදෙස් සංචාර සඳහා සහ අවසරලත් විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සඳහා භාවිත කිරීමට
- ශ්‍රී ලංකාවේ අවසරලත් හෝටල්වල බිල්පත් ගෙවීමට

වැඩිදුර විස්තර : 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/39 දරන සහ 2021 මාර්තු 26 දිනැති අංක 2220/69 දරන රජයේ ගැසට් නිවේදන මගින් ප්‍රසිද්ධ කළ විධානයන්

විදේශ විනිමය දෙපාර්තමේන්තුව, 7/8 මහල, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01.
ටෙලි : 0112477255 ෆැක්ස් : 0112477716 ඊමේල් : dfe@cbsl.lk වෙබ් පිටුව : www.dfe.lk